# පටිමාඝරයන්හි වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳ අධ්‍යයනයක්

යූ.ඒ. චතුරි සුමුදුමලි*

පටිමාඝර යනු  බෞද්ධ ගෘහ නිර්මාණ සම්ප්‍රදාය තුළ බුද්ධ ප්‍රතිමාවක් ආවරණය කිරීම සඳහා නිර්මිත ගෘහයකි. ක්‍රි.ව. 5 වන සියවස පමණ වන විට බුද්ධ ප්‍රතිමා නිර්මාණයේ ඇති වූ සංවර්ධන අවස්ථාවන් හේතුවෙන් මෙම පටිමාඝර නිර්මාණය කිරිම ආරම්භ වූ බව සැලකේ. ක්‍රි.ව. 4 සහ 5 යන සියවස්වල ප්‍රචලිත වූ පබ්බත විහාරාරාමවල ඇතුළත මළුවේ ගොඩනැගිලි සඳහා ස්තූපය, බෝධිය, යන අංගයන් එක් තැන් කරමින් බුදුන් අනුස්මරණය කිරීමේ ත්‍රිකෝණාකාර සම්බන්ධතාවයක් පෙන්වීමට පිළිම ගෙය යොදාගෙන ඇති බව විශ්වාස කෙරේ. පාලි භාෂාවෙන් මෙය ගන්ධ කුටි නමින් හැඳින්වෙන අතර ගන්ධ කුටි යනු දඹදිව සැවැත් නුවර බුදුන් වහන්සේ සඳහා වෙන් කළ කුටියට ව්‍යවහාර කළ නාමය වේ. ශ්‍රී ලාංකික පටිමාඝරයන් හි ආරම්භක අවස්ථාව ගන්ධ කුටි වර්ගයේ පටිමාඝරවලින් පිළිබිඹු වන අතර අනුරාධපුර නගරය අවට සීමාව තුළ ඒවා විස්සකට වැඩි ප්‍රමාණයක් හඳුනාගෙන ඇත. ප්‍රධාන වශයෙන් මෙම පටිමාඝර නිර්මාණය කිරීමේ අරමුණ වී ඇත්තේ බුද්ධ ප්‍රතිමාව ස්වාභාවික උවදුරු වලින් ආරක්ෂා කර ගැනීමයි. වර්තමානය වන විට මෙරට දක්නට ලැබෙන පටිමාඝර විශේෂ පහකි. ගන්ධකුටි, පාසාද, ගෙඩි ගෙවල්, ලෙන් විහාර, ටැම්පිට විහාර ආදී ලෙස හඳුන්වා දිය හැකිය. පටිමාඝර තැනීම පිළිබඳව මූලාදර්ශ කිහිපයක්ම භාරතීය චෛත්‍ය ගෘහ වලින් ශ්‍රී ලංකාවට ලැබුණි. පටිමාඝරයන්හි ආරම්භය, ඉතිහාසය හා විකාශය පිළිබඳවත් විශේෂයෙන් ම ඒවායෙහි ඇතුළත් වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳව අධ්‍යයනය කිරීම මෙහි මූලික අරමුණ ලෙස සඳහන් කළ හැකිය. එමෙන්ම නටබුන් අතර කැපී පෙනෙන අංගයක් වන පටිමාඝරවල ගෘහ නිර්මාණ ශිල්පය හා සෞන්දර්යාත්මක ජීවගුණය සම්බන්ධයෙන් නිවැරදි අවබෝධයක් ලබා දීම මෙයින් අපේක්ෂිත ප්‍රතිඵලය වේ. එපමණක් නොව පටිමාඝර ඉදිකිරීම සම්බන්ධ ඓතිහාසික පසුබිම හා ඒ පිළිබඳව පවතින බෞද්ධ විග්‍රහය හඳුනා ගැනීම ද තවත් ප්‍රතිඵලයකි. පටිමාඝරයන්හි වාස්තු විද්‍යාත්මක ලක්ෂණ අධ්‍යයනය කිරීම සඳහා සාහිත්‍යමය මූලාශ්‍ර ද භාවිත කෙරෙන අතර එහිදී ප්‍රාථමික මූලාශ්‍ර මෙන්ම ද්විතීයික මූලාශ්‍ර ද භාවිත කෙරේ. ලක්දිව බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පය තුළ වැදගත් ඉදිකිරීම් විශේෂයක් වන පටිමාඝරයන් හි සැබෑ ඓතිහාසික වටිනාකම සම්බන්ධයෙන් නිවැරදි අවබෝධයක් ලබා ගැනීමට මෙම අධ්‍යයනය ප්‍රයෝජනවත් වනු ඇත.

ප්‍රමුඛ පද - බෞද්ධ, ගෘහ නිර්මාණ, ප්‍රතිමා, පටිමාඝර, වාස්තු විද්‍යාව

* පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය,  කැලණිය විශ්වවිද්‍යාලය chathurisumudumalie@gmail.com